## මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව – 2014

**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනතේ 24 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

### 1.3 විගණකගේ වගකීම.

**මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.**

**මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.**

**මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07**

සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.2,940,950 ක් වූ වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද එහි සාධාරණ අගය ගිණුම්වල පෙන්නුම් කිරීම සඳහා වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වසර 1ත් 3ත් අතර කාලපරිච්ඡේදයකට අයත් එකතුව රු.29,580 ක්වූ ගෙවිය යුතු වියදම් අයිතම් 03ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ආ) 2013 ජූලි 15 දින පවත්වන ලද පාලක සභා රැස්වීමෙහි තීරණයට අනුව, සභාවේ හිටපු සභාපතිගෙන් සභාවට අයවිය යුතුව ඇති රු.71,162 ක මුදල අයකර ගෙන නොතිබුණි.

**2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතේ 3(1) වගන්තිය | සභාවේ සංයුතිය, තනතුරු මත නිල බලයෙන් පත්වන සාමාජිකයන් 15 ක් හා අමාත්‍යවරයා පත් කරනු ලබන සාමාජිකයන් 5 කින් සමන්විත විය යුතු වුවද අමාත්‍යවරයා විසින් සාමාජිකයන් 4 දෙනෙකු පමණක් පත්කර තිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කළ යුතු වුවද සභාව විසින් එවැනි ලේඛනයක් පවත්වා ගෙන |

| | |
|---|---|
| | ගොස් නොතිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සෑම ගිණුම් කටයුත්තක් වෙනුවෙන්ම ස්ථාවර වත්කම් රෙජිස්ටරයක් පවත්වා ගත යුතු වුවද සභාව විසින් සියළුම ස්ථාවර වත්කම් මිලදී ගැනීම් ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කර තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේදී සභාවේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.1,187,102 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.292,661ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.894,441 ක වර්ධනයක් විය.

4. මෙහෙයුම් සමාලෝචනය.

4.1 කාර්යසාධනය

1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතෙහි 14(1) ඡේදය යටතේ සභාවෙහි කාර්යය සහ කර්තව්‍යයන් 06ක් දක්වා ඇත. එමෙන්ම එහි පළවන උපලේඛණය යටතේ රටෙහි මානව සම්පත සංවර්ධනය වෙනුවෙන් ඉටුකළ යුතු කාර්යයන් සහ කර්තව්‍යයන් තවදුරටත් විස්තර කර දක්වා ඇත. එහෙත් පසුගිය කාල පරිච්ඡේදයට අදාලව සකස් කරන ලද සැලසුම් මෙන්ම එහි තථ්‍ය ක්‍රියාකාරීත්වයද පනතෙහි සඳහන් පහත කරුණු ඉටුකිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ .

(අ) ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සහ ක්‍රියාත්මකව පවත්නා සැලසුම් සහ වැඩසටහන් කලින් කල සමාලෝචනය කිරීම හා පරීක්ෂා කර බැලීම සහ අවශ්‍ය වන විටක ඒ ප්‍රතිපත්තියට, සැලසුම්වලට සහ වැඩසටහන්වලට කළයුතු වෙනස් කිරීම්වලට අදාළ නිර්දේශ අමාත්‍යවරයාට සභාව විසින් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ආණ්ඩුව විසින් අනුමත කරන ලද මානව සම්පත් සංවර්ධන සැලසුම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ගැන සොයා බලා නොතිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

රටෙහි මානව සම්පත් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණ හා නිර්දේශ වඩාත් ඵලදායි වන පරිදි හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ හැකිවන පරිදි පනතෙහි 3වන උප වගන්තිය අනුව මානව සම්පත් සංවර්ධන සභාව වෙත පත්වන සාමාජිකයන් රටෙහි ආර්ථික හා මානව සංවර්ධන ක්ෂේත්‍රයන් හා සම්බන්ධ සියළුම ආයතනවල ප්‍රධානීන්ගෙන් සැදුම්ලත් 20 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් විය යුතුවේ.

එහෙත් සමාලෝචිත වර්ෂය තුල පවත්වන ලද පාලක මණ්ඩල රැස්වීම් වාර්තා හා රැස්වීම් සඳහා සාමාජිකයන්ගේ සහභාගීත්වය පරීක්ෂා කිරීමේදී ඉහත අරමුණු ඉටුකර ගැනීමට සභාවේ සාමාජිකයන්ගේ දායකත්වය සැලකිය යුතු අවම මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද පාලක සභා රැස්වීම් 06ක් සඳහා පත්කර තිබූ සාමාජිකයින් 19 දෙනෙකු අතුරින් එක් වරක් හෝ සහභාගි නොවූ සාමාජිකයින් සංඛ්‍යාව 07 දෙනෙකි.

(ආ) පවත්වන ලද සියලුම රැස්වීම් වාර සඳහා සහභාගි වී තිබුණේ සභාපතිවරයා හා තවත් සාමාජිකයන් දෙදෙනෙකු පමණක් බවත්, එක් රැස්වීම් වාරයකට පමණක් සහභාගි වූ සාමාජික සංඛ්‍යාව දෙදෙනෙකු බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

**4.3** මෙහෙයුම් අකාර්යක්ෂමතා.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්මට අනුව මැදපෙරදිග සංක්‍රමනික කම්කරුවන්ගේ සහ ඔවුන්ගේ සමාජ විඥාණය සම්බන්ධ ව්‍යාපෘතියේ අවසන් වාර්තාව සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මෙම ව්‍යාපෘතිය සැලසුම්කර මාස 06කට පසු ක්‍රියාත්මක කර තිබූ අතර ඒ සඳහා රු.මිලියන 0.35ක් වැයකර තිබුණද වාර්තාව 2015 ජුනි 18 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) උතුරු පළාතේ මුලතිව් දිස්ත්‍රික්කයේ යුද්ධයෙන් අවතැන් වූ වරප්‍රසාද නොලත් පවුල් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පවුල් 7,000ක් සම්බන්ධයෙන් සමීක්ෂණ කටයුතු සිදුකිරීමට සැලසුම් කර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1.6ක් වැයකර තිබුණි. ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුළදී අවසන් කළ යුතු වුවත්, 2015 ජුනි 18 දින වන විටත් වාර්තාවන් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) දේශීය හා ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපල අධ්‍යයනය සම්බන්ධ ව්‍යාපෘතිය රු.මිලියන 4 ක් වැය කරමින් පෞද්ගලික ආයතනයක් ලවා සමීක්ෂණය සිදුකර තිබුණි. එම ආයතනය විසින් සමීක්ෂණය සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර තිබූ නමුත් එම වාර්තාව සභාවේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා දායක කරගෙන නොතිබුණි.

**4.4** කාර්ය මණ්ඩල පරිපාලනය.

(අ) සභාවට 2013 වර්ෂයේදී නිලධාරීන් 20ක් බඳවාගෙන තිබූ අතර එම වර්ෂයේදීම නිලධාරීන් 03ක් ඉවත්ව ගොස් තිබුණි. සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 09 දෙනෙකු බඳවාගෙන තිබුණ අතර 09 දෙනෙකු ඉවත්ව ගොස් තිබුණි. ඒ අනුව නිලධාරීන් සේවය හැරයාමේ තත්ත්වයක් පවතින බවත් අනුමත කාර්ය මණ්ඩලය වූ 33 දෙනාගෙන් පස්දෙනෙකු සඳහා පුරප්පාඩු පවතින බවත් අත්‍යවශ්‍ය තනතුරක් වන පර්යේෂණ නිලධාරීන්ගේ සංඛ්‍යාව 04කට සීමා වී පැවතියදීත් ඉන් එක් පුරප්පාඩුවක් පවතින බවත් නිරීක්ෂණය විය.

**4.5** වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් සභාවේ සම්පත්

සභාවේ ස්ථිර සේවයට බඳවාගෙන තිබූ රියදුරු මහතකුගේ සේවය වසර 05කට අධික කාලයක් වෙනත් රාජ්‍ය ආයතනයක සේවය සඳහා යොදවා තිබුණි.

**4.6** ආර්ථික නොවූ ගණුදෙනු

සභාව විසින් මාස 06කට වරක් නිකුත් කරනු ලබන නිවුස් ලෙටර් නැමැති පුවත්පතේ ජුනි කලාපය මුද්‍රණය සඳහා ඒකක 500කට රු.43,411 ක් වැයකර තිබූ අතර දෙසැම්බර් කලාපය ඊට වඩා ඝන කඩදාසියෙන් මුද්‍රණය කිරීමට රු.79,236ක් වැයකර තිබුණි. මේ අනුව රු.35,825ක අනවශ්‍ය වියදමක් දරා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

**2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 උපඡේදය පරිදි පූර්ව තෙවර්ෂයේ මෙහෙයුම් පිළිබඳව සමාලෝචනයක් වර්ෂ 2013 සිට 2017 දක්වා කාලසීමාවට සකස් කළ සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගතව නොතිබුණි. එමෙන්ම මුදුන් පමුණුවා ගතයුතු ඉලක්කයන්හි මූල්‍යමය අගයන් දක්වා නොතිබුණි.**

## 6. පද්ධති හා පාලනයන්

**විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.**

**(අ) ගිණුම්කරණය**

**(ආ) වත්කම් කළමනාකරණය**